**උ.ප.රා.සේ.කො.ස චක්‍රලේඛ අංක:17/2025**

මගේ අංකය:NP/07/10/01/185 (I)
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය
2025.05.21

ප්‍රධාන ලේකම්
ආණ්ඩුකාරවර ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි II වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2025**

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අංක CP/DEC/25 දරණ 2025.02.19 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද 2025.02.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරවත්, උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම ප්‍රකාරවත්, උතුරු පළාත් රාජ්‍ය සේවයේ **පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි II ශ්‍රේණියේ** පවතින පුරප්පාඩු සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව මෙම චක්‍රලේඛයෙහි සඳහන් සියලුම සුදුසුකම් සහිත අයදුම්කරුවන්හට මේ සඳහා අයදුම් කළ හැකිය. මෙම බඳවාගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2025.06.13** වේ.

**02.** බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1. 2013.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද පරිවාස නිලධාරි තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාවේ සහ 2016.07.12 දින සිට ක්‍රියාත්මක පරිවාස නිලධාරි තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ වන සඳහන් කොන්දේසි වලට සහ එහි කලින් කලට සිදුකරන ලද සංශෝධනවලට අනුව ද, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති අනුකූලව තෝරාගන්නා අයදුම්කරුවන් **පරිවාස නිලධාරි තනතුරේ II වන ශ්‍රේණියට** බඳවා ගනු ලැබේ.

02.2. මෙම විභාගයෙන් සමත්වන, පත්වීමක් සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් සේවා ව්‍යවස්ථාවේ සඳහන් වැඩ බැලීමේ කාලසීමාවට යටත්ව **පරිවාස නිලධාරි II වන ශ්‍රේණියට** පත්කරනු ලැබේ. කෙසේ වෙතත් දෙපාර්තමේන්තු ප්‍රධානියා අදාළ නිලධාරියාගේ සේවය, හැසිරීම සහ පැමිණීම යනාදිය පිළිබඳව තෘප්තිමත් නොවන්නේ නම් වැඩ බැලීමේ කාලසීමාව දීර්ඝ කළ හැකිය.

02.3. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථාවේ සහ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පරිවාස නිලධාරි II වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර 03 ක් ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.

02.4. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් **"උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය"** යන කොන්දේසියට යටත් විය යුතුය.

02.5. පත්වීම් සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්ගේ 2025.04.25 දිනැති ලිපිය මගින් මෙම තනතුර සඳහා සීමිත තරඟ විභාගය මගින් බඳවාගැනීම සඳහා නිවේදනය කරන ලද **30%** ට අදාළ **පුරප්පාඩු සංඛ්‍යාව දෙක (02) කි.** කෙසේ වෙතත් නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

02.6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 03 ක් අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

## 03. වැටුප් පරිමාණය

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, MN 5-2025 අනුව **පරිවාස නිලධාරි II වන ශ්‍රේණියේ තනතුර** සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.58,660 -10 X 1,190/= - 11 X 1,360/= - 15 X 1,670/= - 110,570/=** ක් වේ. (රු.62,230/= වැටුප් පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය).

## 04. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

**(අ)** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට රාජ්‍ය සේවයේ හෝ උතුරු පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ප්‍රකාරව MN 2 -2025, MN 3 -2025, MN 4 - 2025 යන වැටුප් කේත සහිත කුමන හෝ සේවයක / තනතුරක අවම වශයෙන් **වසර පහක (05) ක** සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට උතුරු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ප්‍රකාරව MN 2 -2025, MN 3 -2025, MN 4 - 2025 යන වැටුප් කේත සහිත කුමන හෝ සේවයක / තනතුරක අවම වශයෙන් **වසර පහක (05) ක** සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(ආ)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යාව (Sociology) / මනෝවිද්‍යාව (Psychology) / අපරාද පරීක්ෂණ විද්‍යාව (Criminology) / නීතිය (Law) / සමාජ සේවා (Social Works) / පෝෂණයවේදය (Nutrition) / දර්ශන විද්‍යාව (Philosophy) / ව්‍යවසායකත්වය ( Entrepreneurship) / උපදේශනය (Counselling), තොරතුරු තාක්ෂණය (Information Technology), කළමනාකරණය (Management), තර්ක ශාස්ත්‍රය (Logic), දේශපාලන විද්‍යාව (Political Science), පරිපාලනය (Administration), මානව විද්‍යාව (Anthropology) යන විෂයයන්ගෙන් ක්‍රමන හෝ විෂයයක් ප්‍රධාන විෂයයක් ලෙස හෝ අනු විෂයයක් ලෙස හෝ ඇතුළත්ව ලබාගත් **ශාස්ත්‍රවේදී උපාධිය.**

## 05. සාමාන්‍ය සුදුසුකම්

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර මෙම තනතුරට අදාළ **අධ්‍යාපන සුදුසුකම් ඇතුළුව පහත සඳහන් සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

05.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

05.2. අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක තම තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීම හැකි යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයෙන් හෙබි පුද්ගලයෙකු විය යුතු අතර මනා හැසිරීමකින් යුතු අයෙකු විය යුතුය.

05.3. අයදුම්කරු මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය)

හෝ

05.4. අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය)

05.5. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහක (05) කාලය තුළ විනය ක්‍රියාමාර්ගවලට යටත් නොවී තිබිය යුතුය.

05.6. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහක (05) කාලය තුළ දී සියලුම වැටුප් වර්ධක නියමිත දිනවල දී උපයාගෙන තිබිය යුතුය.

05.7. **සීමිත තරඟ විභාගයක්** මගින් බඳවා ගන්නා විට **උපරිම වයස් සීමාව** අදාළ නොවේ.

## 06. බඳවා ගැනීමේ පරිපාටිය

06.1. ලිඛිත පරීක්ෂණයක් මගින් කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථාව, බඳවා ගැනීමේ පරිපාටිය, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදිය අනුව **පරිවාස නිලධාරි II වන ශ්‍රේණියට** බඳවාගනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. බඳවා ගැනීමේ දී හෝ බඳවා ගැනීමෙන් පසු අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සියලුම සුදුසුකම්, ඒවා තහවුරු කෙරෙන ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

06.2. ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් අතරින්, ලැබූ වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව පත්වීම සඳහා තෝරා ගනු ලැබේ.

## 07. විභාග ගාස්තු

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස රු.500/= මුදලක් උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට **යාපනය ප්‍රධාන තැපැල් කාර්යාලයෙන්** මාරුකළ හැකි වන පරිදි මුදල් ඇණවුමකින් ගෙවා, අදාළ කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කිරීමේ පිළිවෙල

08.1. මෙම දැන්වීම සමග නිකුත් කරනු ලබන අයදුම්පත සම්පූර්ණ කර 2025.06.13 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් හෝ භාරදිය යුතුය.

08.2. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/185(I) - 2025 "** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3. අයදුම්කරුවන් තම අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුය. ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ නොකරන ලද අයදුම්පත් පිළිගනු නොලැබේ.

08.4. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

08.5. අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක. එසේ ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් පිළිබඳව අදාළ අයදුම්කරුවන් වෙත දන්වා යවනු ලැබේ.

08.6. ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපැල - **exampscnp@gmail.com**)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ඇත්නම් මුදල් ඇණවුමේ සහතික කළ පිටපතක්
- විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ෆැක්ස් අංකය

## 09. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කුමන හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

**11.** අත්සන සහතික කිරීම

**සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ.** අයදුම්කරු තම ආයතන ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුය.

**12.** විභාග පරිපාටිය

මෙම ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ. මෙම විභාගය දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. කෙසේ වෙතත් සුදුසුකම් සපුරන ලද සිංහල මාධ්‍ය අයදුම්පත් ඉදිරිපත් වුවහොත් සිංහල මාධ්‍යයෙන් ද විභාගය පවත්වනු ලැබේ. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. **විභාග ප්‍රශ්නපත්‍රවලට අදාළ විෂයය අන්තර්ගතය ඇමුණුම - I හි දැක්වේ.**

කෙසේ වෙතත්, මෙම විභාගය තරඟ විභාගයක් වන හෙයින් පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයක් සඳහා අවම වශයෙන් **40%** ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු අතර, ප්‍රශ්නපත්‍ර දෙක සඳහාම ලබාගත් මුළු ලකුණු ප්‍රමාණය **50%** ට නොඅඩු විය යුතුය. මෙම තරඟ විභාගයෙන් අයදුම්කරුවන් ලබාගත් වැඩිම ලකුණු පිළිවෙල ( Merit Order) පදනම් කරගෙන පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

<u>සැළකිය යුතුයි</u>

i. මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

ii. මෙම කරුණ සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

iii. මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

iv. මෙම චක්‍රලේඛය ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය යටතේ සේවය කරනු ලබන සුදුසුකම් සහිත සියලුම නිලධාරීන්ගේ අවධානයට යොමුකරන්න.

v. මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**පී. කුගනාදන්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
2025.05.21